

# බ්‍රිස්බේන් නුවර ප්‍රතිභා සන්ධ්‍යාව

නර්තන ආචාර්ය
දිනේෂ් ඈපාසිංහ

මාගේ ජීවිතයේ තවත් එතක් සන්දිස්ථානයක් පසු කිරීමට මා සූදානම් ව මෙසේ ලියමි. අලුයම ශ්‍රී ලංකාවේ වේලාවෙන් 3.30 ට අවදිවී නහවැ එකට සෑම සෙනසුරාදා දිනයකම පැමිණෙන්නේ බ්‍රිස්බේන් නුවර ලංකාරාම විහාරස්ථානයේ මාගේ නර්තන පන්ති ආරම්භ කිරීමේ අරමුණ ඇතිවයි.

'Skype එකෙන් නැටුම් පන්ති '' සමහරෙකුට මෙය විහිලුවට කාරණාවක් විය හැකිය. මෙය කවුරුන් කෙසේ කීවත් එය මා යතාර්ථයක් බවට පත් කර ඇත්තේ බ්‍රිස්බේන් නුවර පමණක් නොව මෙල්බන් නුවරත් පන්ති පවත්වමිනි.

2010 දී මාගේ බිරිඳ ඩිශානි සමඟ ලංකාවට පැමිනුණ දා පටන් අද වන තුරුත් නහවැ පන්තිය ඉතා සාර්ථක ලෙස කර ගැනීමට මූලික අඩිතාලම වැටුනේ බ්‍රිස්බේන් නුවර සිටින කෙනෙක් නිසා වීම සන්තෝෂයට කරුණකි. කාර්මික දුෂ්කරතා නැතුවා නොවේ. ඒ හැම බාධකයක් මැදින් මා ජය ගෙන ඇතැයි සිතේ.

පස් වන වරටත් ප්‍රතිභා සන්ධ්‍යාවේ නර්තන අංග නිර්මාණය කිරීම සඳහා මා හට සහභාගී වීමට හැකි වීම සන්තෝෂයට කරුණකි. මෙවර මාගේ තේමාව වී ඇත්තේ විජය කුවේනි ශ්‍රී ලාංකීය නර්තනයට ඉති ලග සබැඳියාවක් පවත්වන විජය කුවේණි කතාව සැකෙවින් ප්‍රේක්ෂකයාට ලබා දීමට සිතා මාගේ දුවා දරුවන් සමග මෙලෙස විජය කුවේණි කතාව දියත් කලෙමි.

සිද්ධාර්ථ කුමාරයා බුද්ධත්වය ලබා ලංකාදීපයට වැඩියේ මේ කුවේණි ඇතුළු යකුන් මනුෂ්‍යයො කරන්න. ඒත් ඒ ධර්මය නාසා කැලේ පැන්න අමනුෂ්‍යය යක්ෂය-න්ගෙන් පැවත එන කාන්තාවක් කුවේණිය කියන්නේ. විජය රජ තුමා කුවේණියට ලෙන්ගතුකම් පෑමේ අවසාන ප්‍රතිඵලය කුවේණියට දාව දරු දෙදෙනෙක් ඉපදීමයි. කුවේණිය යක්ෂණියක් වුවත් දරු දෙදෙනා අත් නොහැරීම අද සමාජයට කදිම උදාහරණයකි. '' දේව කුල ගෝත්‍රයෙන්, ගණයෙන් වෙනස් වුනාට යක්ෂ, නාග, රාක්ෂ, දේව, සුර, අසුර, මේ සියල්ලම මනුෂ-ෂයෝ බව වටහා ගැනීම '' අපහසු කර්යයක් වුවත් අපහසුවෙන් හෝ වටහා ගැනීම ජීවිතයේ ඉදිරි අනාගතයට කදිම තෝතැන්නකි.

විජය රජු ඉන්දියාවේ සිට පිරිස සමග පැමිණීමත්, ලංකාවට පැමිණ කුවේණියගේ මාර්ගයෙන් ලංකාව අත්පත් කර ගැනීමත්, කුවේණියට දාව දරුවන් ලැබීමත් හා කුවේණිය නෙරපා හැර සමකල කුමරියක් ඉන්දියාවෙන් ගෙන්වා ගැනීම සහ කුවේණියගේ සාපයෙන් විජය රජු අසනීප වීමත් මේ කතාවෙන් පෙන්වීමට මා බලාපොරොත්තු වේ. මෙවැනි කතාවක් ප්‍රේක්ෂකයාට ලබා දීමෙන් මා නිර්මාණ කරුවෙකු විදිහට බලාපොරොත්තු වන්නේ සමාජයේ ඇති කුල මල භේද දුරු කිරීම, මවකගේ සෙනෙහසේ තිබෙන අතිඋත්තම බව, එකාවන්ව ජීවත් වීම හා බුදු දහමේ ඇති උත්තරීතර බව සමාජයට පෙන්වා දීමයි.

මෙලෙස විජය කුවේණි කතාව නර්තන අංගයකට පෙරලා ගැනීමෙන් දියත් කිරීමට සූදානම් වූවත් එම කාර්යය ලේසි පහසු කාර්යයක් නොවන්නේ ඕස්ට්‍රේලියාවේ උපන් දරුවන් සමගින් මෙම කතාවේ චරිත බෙදා ගැනීමට සිදු වූ නිසා-වෙනි. එහෙත් එම කාර්යය මා හට පහසු කාර්යයක් වූයේ දරුවන් හොඳට සිංහල වහර කතා කරනු නිසාවෙනුත් සෑම මසකම නර්තන පන්ති පැවැත්වීමත් නිසාවෙනි. මෙහිදී සියළුම දරුවන්ගේ දෙමව්පියන්ගෙන් ලැබුනු පිටිවහල ඉතා අනර්ගයි. මා යටතේ ඉගෙනුම ලබන දුවා දරුවන් 100 කට වඩා පිරිසක් වේ. මේ සියල්ල පාහේ සෙනසුරාදා දිනයේ ලංකාරාමයට පැමිණෙන්නේ නර්තනය වාගේම යහ ගුණ ධර්ම, සිරිත් විරිත් ඉගෙනීමේ බලාපො-රොත්තුවෙනි. දරුවන්ට මෙම නර්තනය ඉගැන්වීමෙන් දෙමව්පියන් බලාපොරොත්තු වන්නේ දරුවන් නර්තන ගුරුවරුන් කිරීමට නොව ලාංකීය සංස්කෘතිය හා ලාංකීය අනන්‍යතාවය ඉදිරියට රැගෙන යාමේ අරමුණ හා බුදු දහමේ ඇති වටිනාකම දරුවන්ට කියා දීමටයි.

මේතාක් දුර මා හට මෙලෙස ලංකාවේ සිට Skype මාර්ගයෙන් පන්ති පැවැත්වීමට හැකි වූයේ දොස්තර සාගරිකා මහත්මියත් එම මහත්මයත් හා ජයතිස්ස මහත්මයා හා එම මහත්මිය ඇතුළු සියළුම දෙමව්පියන්ගේ උදව් ඇතිවයි. ඒවාගේම ලංකාරාමයේ වැඩ වාසය කරන්නා වූ නායක ස්වාමීන් වහන්සේ ඇතුළු අනෙකුත් ස්වාමීවන් වහන්සේලා හා විහාරස්ථානයේ කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පල කරමි.

තවද ප්‍රතිභා සන්ධ්‍යාවේ මා සමග උරෙන් උර ගැටී වැඩ කරන අනෙක් නර්තන ගුරුවරු සියළුම දෙනා මතක් කරන්නේ හද පිරි සතුටිනි.

ප්‍රථමයෙන් විජය කුවේණි වේදිකා ගත වන අතර දෙවනුව පූජා නර්තනය ලෙස මෙවර වේදිකාවට පැමිණෙන්නේ දෙවිවරුන්ගෙන් සමන්විත නර්තන අංගයකි. එහි රාධා ක්‍රිෂ්ණා / ශිව පාර්වතී / සරස්වතී බ්‍රහ්ම වේ. සෑම වසරකම වාගේ මෙවරත් සියළුම නර්තන අංග නව මුහුණුවරක් ගැනීම ප්‍රේක්ෂකයාට ඉතා හොඳ රසවින්දනයක් ලබා ගැනීමට පිටි වහලක් වේ. ඒ වාගේම රාක්ෂ නර්තනය ගැන කතා කිරීම වටිනා නර්තන අංගයකි. පහතරට නර්තන සම්ප්‍රදායේ එන රාක්ෂ ගණයට අයිති නර්තන අංගයකි. එහි එන පද කොටස් ඉතා අසීරු පද කොටස් වේ. එහෙත් මා යටතේ ඉගෙනුම ලබන වැඩිමහල් දුවා දරු-වන් මේ පද කොටස් ඉතා අනර්ග ලෙස නැටීම පුදුමයට කරුණකි. මාගේ නර්තන අංග ශාස්ත්‍රීය හා නව නිර්මාණ ලෙස ඉදිරිපත්වන අතර හුදු ප්‍රේක්ෂකයාට හොඳ රස වින්දනයක් ලබා ගැනීමට පිළිවන. මා යටතේ ඉගෙනුම ලබන අවු.4, 5 වයසේ ළමුන්ගේ නර්තන අංග ඉතා හොඳ නිර්මාණ 2 ක් ඔබට මා තිළිණ කර ඇත. අවු. 4 සිට විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන දුවා දරුවන් මා යටතේ ඉගෙනුම ලබයි. මේ සෑම ළමයෙකුගේම ඉතා හොඳ මනසකින්මෙම ළමුන් සිටින බව මා ගුරුවරයා විදිය මට හැගේ.

තවද නර්තන නිර්මානය ගැන කතා කිරීමේදී තවකෙකුගේ නිර්මාණ සොරා ගෙන නිර්මාණය කිරීම හා ඇඳුම් පැලඳුම් ඒ ආකාරයෙන්ම නිර්මාණය කිරීම අප නිර්මාණ කරුවන් ලෙස බාල ක්‍රියාවක් වේ. මාගේ නිර්මාණ එකක්වත් තව කෙනෙකුගේ නිර්මාණ සොරා ගෙන නොමැති බවත් මෙම සියළුම නිර්මාණ මගේම ඒවා වීම නිසා ම අද ආඩම්බරයෙන් කතා කරමි. තවද නර්තනය ගැන කතා කිරීමේදී බ්‍රිස්බේන් හි නර්තන ආචාර්ය වරියක් ලෙස වැඩ කල සාගරිකා අත්තුඩාව මහත්මිය ගැන කතා කලයුතුමයි. ඇය වෘත්තියෙන් වෛද-ෳවරියක් කෙසේ නමුත් ඇය නර්තනයට ඉතා දක්ෂ තැනැත්තියකි. මා ලංකාවේ සිට නර්තන නිර්මාණය කරන අතර ඇය සියළුම නර්තන අංග ළමයින්ට පුරුදු පුහුණු කරමින් පෙල ගස්වයි. එම නිසාවෙන් ඇයට තවත් වරක් මාගේ හෘදයාංගම ස්තූතිය.

*<u>බ්‍රිස්බන් නුවර ශ්‍රී ලංකාරාමයට අනුබද්ධිත ශ්‍රී ලංකා කලාකවය මගින් සංවිධානය කල ' ප්‍රතිභා සන්ධ්‍යාව' මෙවර 24 වැනි වරට මාර්තු මස 22 දින බ්‍රිස්බෙන් නුවරදී වේදිකා ගත විය.</u>*

*<u>බ්‍රිස්බෙන් නුවර වාසය කරන ශ්‍රී ලාංකික දූ දරුවන් හා දෙමාපියන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් මෙවර ප්‍රසංගය වර්ණවත් විය. මෙවර විශේෂත්වය වූවේ ප්‍රසිද්ධ නැටුම් ආචාර්ය දිනේෂ ඈපාසිංහ ලංකාවේ සිට පුරුදු පුහුණු කරවා සාගරිකා අත්කුඩාව මහත්මියගේ මගපෙන්වීම තුලින් ඉදිරිපත් කල අංග කිහිපයකි.</u>*

*<u>ඊට අමතරව බ්‍රිස්බෙන් නුවර සිටින අනිකුත් නැටුම් ආචාර්යවරුන්ගේ නැටුම් ද ගීත හා නාට්‍යවලින් වර්ණවත් වූ 'ප්‍රතිභා සන්ධ්‍යාවට' ශ්‍රී ලංකාරාමයේ 'ය-ශෝධරා දහම් පාසලේ' දරු දැරියන් විශාල පිරිසක් ද සහභාගි වූහ.</u>*

එසේ නම් ප්‍රතිභා සන්ධ්‍යාවට නන් අයුරින් උදව් කල හැමටත් මා යටතේ ඉගෙනුම ලැබූ දුවා දරුවන්ටත් විශේෂ සහය දුන් ආනන්ද මහතාටත් මාගේ ස්තූතිය. එසේ නම් හැකි ඉක්මනින් ඕස්ට්‍රේලියාවට පැමිණීමේ බලාපො-රොකත්තුවෙන් සමුගනිමි.



## හරිම් රජ සැපා




''මහරජාණෙනි, මොකක්ද මේ වෙන්ට යන වින්නැහිය?''

''මක්කද බොල වෙන්ට යන්නේ''
''කක්ක වෙන්ට වගේ''
''මොනව මොනව බොල?''

''තරහ අවසර මහරජාණෙනි, දන්න හැම සෙල්ලමක්ම දාලත් ජිනීවා ඡන්දෙන් පරාදයිනේ''

''පර සුද්දෝ මොන කෙංගෙඩියක් කරන්ඩද බොල මට. දේශ මාමක ජනතාව මා සමඟ''

''මේ සැරේ නම් ඒකත් වැල වෙලා වගේ මහ රජාණෙනි,
හැම සංවර්ධනේම කොරළත් දකුණයි බස්නාහිරයි ඡන්ද ලක්ෂ ගානකින් අඩුවෙලා''
''හුඃ ඉතිං''

''මෙහෙම ගියොත් ඔබතුමාගේ මහා රාජ පදවියටත් වැඩි ආයුෂයක් නැති වෙන්ට පුළුවන්''
''ඉතිං''

''තවත් බල බල ඉන්නෙ නැතිව පරම්පරාව බේරගන්න මොනව හරි කරන්නේ නැත්ද මහ රජාණෙනි?''
''මොකද නැත්තේ?''

''මොකක්ද කරන්න යන්නේ?''

''රජකමට කෙළවෙන්න ආවොත් ඒක අතෑරලා දාලා ආඥාදායකකම බාරගන්නවා බං, වෙන මොනව කරන්නද? හොං හොඃ හොඃ''

ම.රා. සාද්


